# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2035/4 - 2017 සැප්තැම්බර් මස 04 වැනි සඳුදා - 2017.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/7/5/32.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 3/99/ඊ/220.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරළේ, 515 ඩී, වතුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ, මුල්හල්කැලේ වත්ත, පේරපිටිය කුඹුර. ගල්ලෙනගාව හේන පිහිටි අ.ග.පි. 615 පිඹුරේ පෙන්වා දී ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2178, 0.3140 ක් වන කැබලි අංක 61, 63 න් පෙන්වා දී ඇති ඉඩම්.

**1. කැබලි අංක 61**
ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත, පේරපිටිය කුඹුර, ගල්ලෙනගාව හේන; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කේ. ඩී. තමරා නන්දනී, කේ. ඩී. පත්මා විජේලතා සහ එම් කරුණාවතී; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවුරුදු 20-25 පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි 02 ක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.2178.

**2. කැබලි අංක 63**
ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත, පේරපිටිය කුඹුර, ගල්ලෙනගාව හේන; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඩී. එම්. දිසානායක; ඉඩම් පරිහරණය: ගෙවත්ත, අවුරුදු 25-30 පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ සොහොනක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.3140.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2017 අගෝස්තු මස 10 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09– 436


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 26190 –19 (2017/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.